# SOUTH EASTERN UNIVERSITY OF SRI LANKA

## SECOND YEAR EXAMINATIONS IN BACHELOR OF ARTS (EXTERNAL) - 2008 / 2009
## HELD IN AUGUST - 2009

## SIN 2.15 – SINHALA GRAMMAR AND WRITING

පළමුවන ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

Time: 03 Hours

---

1. නූතන සිංහල හෝඩිය ලියන්න.

2. (i) පහත සඳහන් පිල්ලම් කවර ස්වර සඳහා යෙදෙන්නේද?

   ා, ැ, ෑ, ි, ී, ෙ, ෛ

   (ii) 'උ' ස්වරය සඳහා යොදන පාපිල්ල ත්‍රිවිධාකාර වේ. ඒ සඳහා උදාහරණ දෙන්න.

   (iii) ව්‍යංජනයකට පරව එ, ඒ, ඓ ස්වර යොදා දක්වන්න.

   (iv) 'ඇ' හා 'ඈ' ස්වර දෙක 'ක්', 'ග්', 'ජ්', 'ර්' යන ව්‍යංජන සමඟ ලියා දක්වන්න.

3. (i) කළු අකුරින් මුද්‍රිත වැරදි අක්ෂරය වෙනුවට ගැළපෙන අනුස්වාරය හෝ විසර්ගය යොදා නැවත ලියන්න.

   I. ලන්කාව

   II. ගින්ගග

   III. නපුන්සක

   IV. පොල්මහ්කාරයා

   V. සන්ස්ථාව

   VI. අන්තප්පුරය

   (ii) පහත දැක්වෙන වචනවල මහප්‍රාණ අක්ෂරය තෝරා ලියන්න.

   ආඛ්‍යාතය, උට්ඨාන, පීඨය, ආඪ්‍ය, අභ්‍යාස, සම්ඵප්‍රලාප

   (iii) පහත දැක්වෙන වචනවල ඇති සඤ්ඤක අකුරු තෝරා ලියන්න.

   පඹයා, අඹ, ඇඹුල්, මඳ පවන, මඬල, අඟ පසඟ, ගඟ, හොඳ

4. පිලි ලියා නම් කරන්න.

5. (i) පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග හා නපුංසක ලිංග නාම සඳහා නිදර්ශන හතර (04) බැගින් දෙන්න.

(ii) ද්‍රව්‍ය නාම හා ගුණ නාම සඳහා නිදර්ශන හතර (04) බැගින් දෙන්න.

6. (i) පහත දක්වෙන ක්‍රියාපද කුමන වර්ගයකට අයත් වේද?

**ජයවේවා!, සුවපත් වේවා!, නිවන් සැප ලැබේවා!, නිදුක් වේවා!**

(ii) පහත වාක්‍යවල පූර්ව ක්‍රියා තෝරා ලියන්න.

I. මම බත් කා නිදා ගත්තෙමි.

II. ඇය පොත් පාඩම් කොට පාසල් ගියාය.

III. මම ජයග්‍රහණය අසා සතුටු වූයෙමි.

IV. මම පාසල් ගොස් ඉගෙන ගත්තෙමි.

V. ගොවියා වැට බැඳ වී වපුරයි.

7. (i) සුදුසු ආඛ්‍යාත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

I. ගොවියෝ කුඹුර...............................

II. මම පන්සල් ගොස් බුදුන් වැඳ ගෙදර ...............................

III. අම්මා මල්ලීට කිරි ...............................

IV. මී මැස්සෝ රොන් ගෙන ...........................

V. නංගී ගීයක්............................

VI. මල්ලීත් මමත් ගමට ...............................

(ii) හිස් තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

I ඒ නුවර බොහෝ ............................ සිටිති.
**(වෙළෙඳුන්, වෙළෙන්දෝ, වෙළෙඳකු)**

II රජු තම ........................... රජ සබයට කැඳවීය.
**(ඇමැතියෝ, ඇමතියන්, ඇමැතියෙක්)**

III අපි .................. එන මඟෙහි රැක සිටියෙමු.
**(සතුරෝ, සතුරන්, සතුරෙක්)**

IV ................................ මී බී මත්ව නද දෙති.
**(බමරු, බමරුන්, බමරෙක්)**

V හොඳ දරුවෝ .............................. දෙන අවවාද පිළිගනිති.
**(ගුරුවරු, ගුරුන්, ගුරුවරයෝ)**

8. එක්කෝ වචන දෙසීයකට නොඅඩු රචනාවක් ලියන්න. නැත්නම් ඔබේ ජීව දත්ත ඇතුළත් ඉල්ලුම් පත්‍රයක් පිළියෙළ කරන්න.

**(නියම නම හෝ ලිපිනය භාවිත නොකරන්න)**

***